# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1998 අංක 7 දරන
## රාජ්‍ය මුද්‍රණ සංස්ථා (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 1998 මාර්තු මස 27 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 මාර්තු මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 3.50 තැපැල් ගාස්තුව : රු. 2.50

## 1998 අංක 7 දරන රාජ්‍ය මුද්‍රණ සංස්ථා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1998 මාර්තු මස 27 වන දින.]

එල්. ඩී.–ඕ. 6/93.

### 1968 අංක 24 දරන රාජ්‍ය මුද්‍රණ සංස්ථා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

**1.** මේ පනත 1998 අංක 7 දරන රාජ්‍ය මුද්‍රණ සංස්ථා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 51 දරන පනතින් අවසන් වරට සංශෝධිත 1968 අංක 24 දරන රාජ්‍ය මුද්‍රණ සංස්ථා පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ :– — 1968 අංක 24 දරන පනතේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ (ඇ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :–

"(ඇ) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව සඳහා මුද්‍රණය කරනු ලබන හෝ ප්‍රකාශයට පත් කරනු ලබන පොත්පත් සහ ප්‍රකාශන හැර, සංස්ථාව විසින් හෝ ශ්‍රී ලංකාවේ වෙනත් යම් ආයතනයක් විසින් හෝ මුද්‍රණය කරනු ලබන හෝ ප්‍රකාශයට පත් කරනු ලබන, පොත්පත්, අධ්‍යාපනික ආධාරක, පුවත්පත්, සඟරා හා වෙනත් ප්‍රකාශන විකිණීමේ, බෙදා හැරීමේ හා අපනයනය කිරීමේ සහ විදේශයන්හි මුද්‍රණය කරනු ලබන හෝ ප්‍රකාශයට පත් කරනු ලබන පොත්පත්, අධ්‍යාපනික ආධාරක, පුවත්පත්, සඟරා හා වෙනත් ප්‍රකාශන ආනයනය කිරීමේ කාර්යය භාර ගැනීම ;" ;

(2) ඒ උපවගන්තියේ (ඈ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :–

"(ඈ) පොත්පත්, අධ්‍යාපනික ආධාරක, පුවත්පත්, සඟරා සහ වෙනත් ප්‍රකාශන හවුලේ ප්‍රකාශයට පත් කිරීමේ කාර්යය භාර ගැනීම ;" ;

(3) ඒ උපවගන්තියේ (ඉ) ඡේදය, එහි (උ) ඡේදය වශයෙන් නැවත අංක කිරීමෙන් ; සහ

2—D 045767 —5,900 (97/09)

(4) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් :-

"(ඉ) ලිපිද්‍රව්‍ය සහ වෙනත් අනුයාත ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ, ආනයනය කිරීමේ, අපනයනය කිරීමේ, මිල දී ගැනීමේ සහ විකිණීමේ කාර්යය භාර ගැනීම :

(ඊ) මුද්‍රණය කිරීමට හෝ ප්‍රකාශනයට අදාළ වෙනත් යම් සේවා සැපයීම : සහ ".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.